**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද අපරාධය: හමුදාව ෂෙල්වෙඩි දමා සිවිල් ජනයා ඝාතනය කරයි

## War crime in Sri Lanka: Civilians slaughtered by army shelling

**බිල් වෑන් ඕකන් විසිනි**

**2009 මැයි 11**

සති අන්තයේ ඊනියා යුද මුක්ත කලාපයක් ලෙස නම් කර ඇති රටේ ඊසානදිග වෙරළබඩ තුනී බිම් තීරුවකට හමුදාව විසින් එල්ල කරන ලද අනුකම්පා විරහිත බෝම්බ ප්‍රහාර මගින් දහස් ගනනක් දෙමල සිවිල් ජනයා මරනයට පත් කිරීම සහ තුවාල සිදු කිරීම ආන්ඩුව විසින් කරන ලද ම්ලේච්ඡ යුද අපරාධයකි.

බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) විසින් තවමත් පාලනය කරනු ලබන අවසාන භූමි ප්‍රදේශය තුල යුද මුක්ත කලාපයේ පිහිටි මුල්ලයිවයිකාල් ක්ෂේත්‍ර රෝහලේ රජයේ වෛද්‍යවරයෙකුට අනුව ඉරිදා ප.ව. 3.00ට රෝහල වෙත ගෙන එන ලද මලසිරුරු සංඛ්‍යාව 378කි. වෛද්‍ය ප්‍රතිකාර සඳහා පැමිනි තුවාලකරුවන්ගේ සංඛ්‍යාව 1,122කි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා විසින් මෙම ගනන් හිලවුවලට පිටුවහලක් සපයා ඇත. "සියයකට අධික ලමුන් ඇතුලු සිය ගනනක් සිවිල් ජනයා එක් රැයක් තුල මරනයට පත්වීම ගැන මතභේදයක් නැත" යි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රකාශක ගෝර්ඩන් වීස් ප්‍රකාශ කලේ ය. "මෙම කුඩා භූමි ප්‍රදේශය තුල බර අවි පාවිච්චි කිරීම පිලිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය සැලිකිලිමත්" වන බව ඔහු තවදුරටත් පැවසීය.

එක් රෝහලකට ගෙනෙන ලද මලසිරුරු සංඛ්‍යාව 400කට ආසන්න නම් සම්පූර්න මරන සංඛ්‍යාව ඊට වඩා බොහෝ ඉහල ය. කලාපය තුල මානුෂික ආධාර සපයන සේවකයන් විසින් ඉරිදා මලසිරුරු 1,200ක් ගනන් කර තිබූ බවත් පොකුරු බෝම්බ, මල්ටි බැරල් රොකට් ලෝන්චර සහ බර කාලතුවක්කු යොදා ගනිමින් ශ්‍රී ලංකා හමුදාව විසින් 2,000ක් පමන සිවිල් ජනයා ඝාතනය කර තිබූ බවත් එල්ටීටීඊ *ටැමිල්නෙට් ඩොට් කොම්* වෙබ් අඩවිය වාර්තා කලේ ය. පැදුරුවල සහ බිම පේලියට දමා තිබූ විකෘත වූ මලසිරුරුවල ඡායාරූප වෙබ් අඩවියේ පලකර තිබුනි. වාර්තා වන ආකාරයට තවත් බොහෝ සිරුරු ප්‍රහාරයෙන් පසුව මලගියවුන්ගේ පවුල් විසින් වල දමා ඇත.

කාලතුවක්කු ප්‍රහාරවලට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රහාරක යානා මගින් ඉරිදා බෝම්බ ප්‍රහාර දෙකක් කලාපයට එල්ල කල බව *ටැමිල්නෙට් ඩොට් කොම්* වාර්තා කලේ ය.

ශ්‍රී ලංකා හමුදාවේ බෝම්බ ප්‍රහාර මගින් සිදුකල මනුෂ්‍ය ඝාතනය ආන්ඩුවේ ප්‍රහාරයේ දී තමන් මෙතෙක් දැක ඇති නරක ම ප්‍රහාරය බවත් තම රෝහල විනාශ වූ බවත් රජයේ කායික වෛද්‍ය වී. ෂන්මුගරාජා ඇසෝෂියේටඩ් ප්‍රෙස් පවෘත්ති සේවයට ප්‍රකාශ කලේ ය.

"අපට හැකි ඉක්මනින් අපි ප්‍රථමාධාර සහ සමහර වෛද්‍ය සැත්කම් කරන්නෙමු" යි වෛද්‍යවරයා පැවසුවේය. "අපට හැකි දෙය අප කරනවා. තත්වය අතිශයින් විනාශකාරී යි: අපගේ පාලනය තුල කිසිවක් නැහැ." තම නිවාසවලට බෝම්බ ප්‍රහාර එල්ල වීම නිසා රෝහල් කාර්යමන්ඩලයේ බොහෝ දෙනකුට වැඩට පැමිනීමට නො හැකි වූහ.

සෙනසුරාදා රාත්‍රියේ ප්‍රථම කාලතුවක්කු ප්‍රහාරය ආරම්භ වූයේ, තුවාල ලැබූ සිවිල් ජනයා ඉවත් කරන රතු කුරුස සංවිධානයේ නැවක් ප්‍රදේශයෙන් ඉවත් වී ස්වල්ප වේලාවකට පසුව ය. දහස් ගනනක් සිවිල් ජනයාට සිය ආරක්ෂාව පතා තාවකාලික බන්කර් යට සැඟවී සිටීමට බලකෙරෙමින් රාත්‍රිය පුරා ප්‍රහාරය අඛන්ඩව සිදු වූ බව වෛද්‍ය ෂන්මුගරාජා කීවේ ය.

දෙමල සිවිල් ජනයාට එරෙහි මිලිටරි ජනඝාතනය ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ශ්‍රී ලංකා ආන්ඩුව විසින් "මානුෂික මෙහෙයුම" සහ "ලෝකයේ විශාලතම ප්‍රාන ඇපකරුවන් මුදාගැනීමේ මෙහෙයුම" ලෙස පටබැඳ තිබේ.

සියලු ම ස්වාධීන ගනන් හිලවු සහ ලබාගතහැකි තොරතුරුවලට ප්‍රතිකූලව ආන්ඩුව ප්‍රකාශ කර ඇත්තේ, ආන්ඩුව අපකීර්තියට පත්කිරීමේ සහ ජාත්‍යන්තර අනුකම්පාව දිනාගැනීමේ උත්සාහයක් ලෙස දෙමල කොටි සංවිධානය විසින් ම දෙමල සිවිල් ජනයාට බර අවි ප්‍රහාර එල්ල කර තිබෙන බව ය.

"එල්ටීටීඊය කරමින් සිටින්නේ මෙයයි; ඔවුන් ඉවක් බවක් නැතිව වෙඩි තබමින් හමුදාවට චෝදනා

කරනවා" යයි හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර පැවසුවේ ය.

එහෙත්, හමුදාව සෙනසුරාදා ප්‍රහාර එල්ල කල බව ආරක්ෂක අමාත්‍යාංශය පිලිගත්තේ ය. "කරායිමුල්ලිවයිකාල් පොදු ප්‍රදේශයේ එල්ටීටීඊ ස්ථාන අල්ලා ගනිමින් ජංගම ගුවන් සේනාංකයට (Air Mobile Brigade) අයත් හටකන්ඩායම් යුද මුක්ත කලාපය තුල ඊයේ ඉදිරියට ගමන් කල බව" ආන්ඩුවේ වෙබ් අඩවිය ඉරිදා වාර්තා කලේ ය.

එල්ටීටීඊ ය විසින් පාලිත වර්ග කිලෝමීටර් කිහිපයක කුඩා භූමි ප්‍රදේශය තුල 10,000-20,000 අතර සිවිල් ජනකායක් පමනක් සිරවී සිටින බව ආන්ඩුව කියන නමුදු එම ප්‍රමානය 120,000 තරම් ඉහල සංඛ්‍යාවක් බව ආධාර සේවකයෝ සහ විදේශ රාජ්‍යතාන්ත්‍රිකයෝ පවසති. එක්සත් ජාතීන්ගේ නිල තක්සේරුවට අනුව එම ගනන 50,000ට වැඩි ය. ශ්‍රී ලංකා හමුදාවේ මරනීය ප්‍රහාරවලට අමතරව ප්‍රමානවත් තරම් ආහාර, පහසුවෙන් ගෙන යා හැකි ජලය සහ බෙහෙත් ද්‍රව්‍ය නැති කමින් ඔවුහු පීඩා විඳිති. වැඩි දෙනා ජීවත්වන්නේ කුඩාරම් තුල ය.

එල්ටීටීඊය සමූලෝත්පාඨනය කිරීමේ සහ එය විසින් පාලිත බිම් තීරුව අල්ලාගැනීමේ ප්‍රයත්නයේ දී බර අවි යොදාගැනීම නතර කල බව ශ්‍රී ලංකා ආන්ඩුව යලි යලිත් ප්‍රකාශ කර තිබේ. හමුදාව කාලතුවක්කු ප්‍රහාර සහ ගුවන් ප්‍රහාර ප්‍රදේශයට එල්ල කරන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ වොෂින්ටනයේ චෝදනා මගින් මෙම ප්‍රකාශය බොරුවක් බව ද යලි යලිත් හෙලිදරව් වී ඇත.

ශ්‍රී ලංකා හමුදාව දිගටම රෝහල්වලට ප්‍රහාර එල්ල කරන බවට විස්තරාත්මක වාර්තාවක් මානව හිමිකම් කන්ඩායමක් වන හියුමන් රයිට්ස් වොච් විසින් සෙනසුරාදා නිකුත් කරනු ලැබී ය.

"සටන් පවතින ප්‍රදේශයේ තිබෙන ස්ථිර සහ තාවකාලික රෝහල්වලට 2008 දෙසැම්බර් මාසයේ සිට 30 වතාවක් ප්‍රහාර එල්ල කර ඇති" බව වාර්තාවේ උපුටා දක්වයි. "ආන්ඩුව විසින් ප්‍රකාශිත යුද මුක්ත කලාපයේ පිහිටි මුල්ලයිවයිකාල් රෝහලට මැයි 2 දා කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල කරමින් 68 ක් මරනයට පත්කිරීම සහ 87කට තුවාල සිදුකිරීම භයානක ම ප්‍රහාරවලින් එකක්" බව එය තවදුරටත් සඳහන් කලේ ය.

වෛද්‍ය පහසුකම්වලට එල්ල කරන මෙම ප්‍රහාර හිතාමතා උවමනාවෙන් ම කරන ස්වභාවයක් පෙන්නුම් කරයි. ප්‍රහාර එල්ල වීම වලක්වා ගැනීම සඳහා ප්‍රහාර එල්ල වූ සෑම අවස්ථාවක ම අලුත් ක්ෂේත්‍ර රෝහලක් පිහිටුවූ බවත් ඒ පිලිබඳව හමුදාව සම්බන්ධීකරනය කරන භූගෝලීය පිහිටීමේ පද්ධතියට (ග්ලෝබල් පොසිශන් සිස්ටම් - ජීපීඑස්) වෛද්‍යවරු විසින් දැනුම් දී තිබූ බව වාර්තාවේ සඳහන් විය. "එහෙත් මෙම දැනුම්දීමෙන් දිනකට පසුව අවස්ථා කිහිපයක දී ම ප්‍රහාර එල්ල වූ බව රෝහල් කාර්ය මන්ඩලය ප්‍රකාශ කලේ ය." විශාල රතු කුරුස සහිතව වෛද්‍ය පහසුකම් මධ්‍යස්ථාන ලෙස ඒවා පැහැදිලිව සලකුනු කර තිබුනත් රෝහල්, ප්‍රහාරවල ඉලක්කයක් වූ බව කාර්ය මන්ඩලය පැවසුවේය.

ජිනීවා සම්මුතිය යටතේ විශේෂයෙන් ම රෝහල් ආරක්ෂා කල යුතු බව වාර්තාව පෙන්වා දී තිබේ. "ශ්‍රී ලංකා හමුදාව විසින් හඳුනාගත් රෝහල්වලට යලි යලිත් කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම යුද අපරාධ පිලිබඳ සාක්ෂි ය" යි හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ අධ්‍යක්ෂ බ්‍රැඩ් ඇඩම්ස් පැවසුවේ ය.

මේ අතර සිය අපරාධ සැඟවීමේ උත්සාහයක් ලෙස රාජපක්ෂ ආන්ඩුව ඉරිදා බ්‍රිතාන්‍ය රූපවාහිනී වාර්තා කන්ඩායම රටින් පිටුවහල් කලේ ය. මෙම හදිසි පිටුවහල් කිරීම, උතුරු ප්‍රදේශය තුල වව්නියාව නගරයේ කටුකම්බිවලින් වට කල තාවකාලික කඳවුරුවල රඳවා සිටින 100,000කට වැඩි දෙමල සිවිල් ජනයා අත් විඳින භයානක කොන්දේසි හෙලිදරව් කරමින් අයිටීවී නාලිකා 4 ප්‍රවෘත්ති ආයතනය මගින් මැයි 5 දා විකාශනය කල ප්‍රවෘත්ති කාන්ඩයක් සඳහා පලි ගැනීමකි.

කඳවුරු තුල "දින ගනන් මලසිරුරු තිබෙන්නට හැරීම, ආහාර සඳහා පොරකෑමේ දී ලමයින් මිරිකී පීඩාවට පත්වීම, කාන්තාවන් සම්බන්ධ ලිංගික අපචාර සහ අතුරුදන්වීම්" ගැන නාලිකා 4හි නික් පැටන් වොල්ෂ් වාර්තා කලේ ය. මෙම කොන්දේසි හෙලා දකින ආධාර සේවකයන්ගේ සම්මුඛ සාකච්ඡා ද ප්‍රවෘත්ති ඛන්ඩයට ඇතුලත් විය.

වාර්තාවේ "පැහැදිලි අරමුන වූයේ ආරක්ෂක හමුදා අපකීර්තියට පත්කිරීම සහ එහි ඉදිරි ගමන කොක්කෙන් හෝ කෙක්කෙන් වැලැක්වීම" බව ශ්‍රී ලංකා ආන්ඩුව ප්‍රකාශ කලේ ය. එල්ටීටීඊ ය දෙමල ජනතාව "මිනිස් පලිහක්" ලෙස යොදාගන්නා බවට චෝදනා කරන ගමන් ම සිවිල් ජනයාට එරෙහි ප්‍රහාර නතර කරන ලෙසට එක්සත් ජනපදය ආන්ඩුවෙන් ඉල්ලා ඇත. "දිගුකාලීන සාමයට සහ ප්‍රතිසංධානයට මග පාදන බලය බෙදාහැරීමේ සැලැස්මක්" රාජ්‍ය දෙපාර්තමේන්තුව පසුගිය මාසයේ දී යෝජනා කලේ ය.

යුරෝපා සංගමය මෙන් ම වොෂින්ටනයේ සැලකිලිමත් වීමේ ප්‍රකාශයන් අතිශයින් ම කුහක ය. මේ දෙගොල්ලන් ම එල්ටීටීඊ ය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස හංවඩු ගසා ඇති අතර "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" නමින් මිලිටරි ප්‍රහාර මුදාහැරීම සඳහා දිරිගැන්වීම් සහ කොලඹ ආන්ඩුවට සෘජු ආධාර සැපයීම් කර තිබේ.

2006 දී යුද්ධය යලි ආරම්භ කල රාජපක්ෂ ආන්ඩුව සිවිල් ජන ඝාතනයේ මිල කොපමන වුවත් එල්ටීටීඊ ය අතු ගා දමන තුරු සහ එහි හට කන්ඩායම් කොන්දේසි විරහිතව යටත් වනතුරු යුද මෙහෙයුම් පෙරට ගෙන යාමට අධිෂ්ඨානශීලීව සිටී.

යුද්ධය පිටුපසින් පවතින සිංහල දේශපාලන ප්‍රභුවේ සැබෑ දේශපාලන අරමුන වන්නේ දෙමල සුලුතරය පමනක් නොව, සමස්ථයක් ලෙස ශ්‍රී ලාංකික කම්කරු පන්තිය මර්දනය කිරීම මගින් සිය බලය සහ වරප්‍රසාද ආරක්ෂා කරගැනීම ය.

වසර 26ට පෙර වාර්ගික ගැටුම පැන නැගුනේ දශක ගනනාවක් පුරා දෙමල ජනයාට වෙනස්කම් කිරීම සහ විශේෂයෙන් ම 1983 දෙමල විරෝධී ජන ඝාතනවල ප්‍රතිවිපාකයක් ලෙස ය.

සන්නද්ධ අරගලය මත පදනම් වූ සහ එක් හෝ තවත් ප්‍රධාන බලයන්ගේ සහයෝගය ඇතිව ස්වාධීන ධනේශ්වර රාජ්‍යයක් නිර්මානය කිරීමේ එල්ටීටීඊයේ ධනේශ්වර බෙදුම්වාදී ක්‍රියාමාර්ගය මෙම ගැටුම තවදුරටත් ගැඹුරු කිරීමට උපකාරී විය.

සිංහල සහ දෙමල ප්‍රභුව අතර දේශපාලන සම්මුතියක් සඳහා එක්සත් ජනපදයේ සහ යුරෝපා සංගමයේ තල්ලුව පිටුපසින් පවතින්නේ සම්පූර්න ජයග්‍රහනයක් ලබනතුරු යුද්ධය පෙරට ගෙනයාමේ ආන්ඩුවේ පිලිවෙත ඔවුන්ගේ භූ-මූලෝපායික උත්සුකතාවන්ට වලකපන දේශපාලන අස්ථාවරත්වයක් ශ්‍රී ලංකාව තුල පමනක් නොව විශාල දෙමල ජනගහනයක් සහිත ඉන්දියාව තුල ම ත් නිර්මානය කරනු ඇතැයි යන භීතිය යි.

ඔවුන් මෙහෙයවෙන්නේ රාජපක්ෂ ආන්ඩුවේ යුද අපරාධ පිලිබඳ හැඟීම්වලින් නො වේ; ඔවුහු ඔවුන්ගේ ම යුද අපරාධ ඉරාකයේ, ඇෆ්ගනිස්ථානයේ සහ අනිකුත් සෑම තැනකම කරති.

© www.wsws.org